# සත්‍ය ලෙස ගැලවීම ලැබූ කිතුණුවාගේ ආශාව (අරමුණු සහ සිත වෙනස් වී ඇත)

## ක්‍රියා 9:1-9

# හැඳින්වීම:

සත්‍ය ලෙස ගැලවීම ලැබූ ඕනෑම කිතුණුවෙකුගේ ජීවිතයේ හැරුම් ස්ථානයක් ඇත එනම් ඔවුන්ගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ ජීවිත වලට ගැලවුම්කරුවාණන් මිදුම්කරුවාණන් ලෙස පිළිගැනීම වේ

නමුත් සමහර කිතුණුවන් ගැලවීම ලැබූ බව
පෙන්වමින් රඟපෑමට උත්සහ කරයි
ඔවුන්ගේ ජීවත වල පෙර තිබූ ක්‍රියා එම
ලෙසම පවතිනවා
අළුත් උත්පත්තියක් නැතිවත් එසේ රඟපායි

2 කොරින්ති 5:17 -සියල්ලම අළුත් වී තිබේ
(ඔවුන්ගේ කථාව ක්‍රියාව සිතුවිලි සහ ආකල්ප)

# දේශනය:

ක්‍රියා 9:1 - හෙබ්‍රෙව් නාමය සාවුල්/ රෝම නාමය පාවුල්

ක්‍රියා 8:1-3 - යෙරුසලමේ සභාව නාස්ති කළා

ක්‍රියා 22:4-5 - සාවුල් සභාවට පීඩා කළා

ක්‍රියා 26:9-11-අග්‍රිපා රජු ඉදිරියේදී

ක්‍රියා 9:2 - ක්‍රිස්තියානි ධර්මය හඳුන්වන්නේ මාර්ගය ලෙසය
ඒ මුල් සභාව භාවිතා කළ නාමයයි

ලබ්ධි මාර්ග - ග්‍රීක් අර්ථය හයිරේසිස් (ප්‍රධාන ආගමෙන් පිටත වෙනත් අදහස් දරන ඇදහිලි ක්‍රම)
ක්‍රියා 5:17 / ක්‍රියා 24:5

ක්‍රියා 22:4 /19:9/ 24:14 - මාර්ගය

ක්‍රිතුණු ධහම මාර්ගයද සත්‍යද ජීවනයද වන
බැවින් සැබවින්ම මනුෂ්‍යයාගේ ගැලවීම වේ.
එම මාර්ගය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

යොහාන් 14:6

ක්‍රියා 9:3 - හදිස්සියේ දීප්තිමත් ආලෝකයක් ඔහු වටා බැබළුනේය එම ආලෝකය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

ශු යොහාන් 8:12

එළිදරව් 21:23

එම ආලෝකය ඔහුගේ ජීවිතයට උදව් කළා.

ඔහුගේ ජීවිතයේ වෙනසක් සිදුවිය.

ක්‍රියා 9:4 - දෙවියන්වහන්සේ අපට කථාකරන විට අපටම ආවේනික වූ ලෙස, අපට ආවේනික දුර්වලකමට කථාකරනසේක.

ශු යොහාන් 4:13-18

ක්‍රියා 9:5 - නුඹ පීඩාකරන යේසුස් මමය
ක්‍රියා 22:10 - මම කුමක් කළ යුතුද?

පාවුල්තුමාගේ ජීවිතයේ හැරීමේ පළමු ක්‍රියාව මෙය විය.
අද දවසේ ඔබගේ මගෙත් ජීවිත වල මෙම හැරවුම් ස්ථානයට පැමිනිය යුතුය.
යෙසායා 6:5-8 / ලූක් 19:8-9 (සාකෙවුස්)

දැන් පාවුල් ස්වාමින්වහන්සේට වුවමනා දේ
කිරීමට සූදානම් විය.
ඔහු තමාගේ ආශාව සහ අරමුණ අතහැර
දැමීය.
සෑමවිටම සැබෑ හැරීමකදී මනුෂ්‍යයාගේ
සිතේ ආශාවන් සහ කැමැත්තෙහි වෙනස්
වීමක් සිදුවිය යුතු වේ.
රෝම 12:2

# අදාල කිරීම:

තවමත් ඔබ එම ආලෝකය ලබා නැද්ද?
එම ආලෝකයට ඇතුල් වී නැද්ද?
ඔබගේ ආශාව හා කැමැත්ත අතහැර නැද්ද?
සිත වෙනස් කරගෙන නැද්ද?

වෙනස් වෙමු -යාච්ඤා කරමු